# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම
## (සංස්ථාගත කිරීමේ)

**ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නෙරංජන් වික්‍රමසිංහ මහතා විසින්
2012 දෙසැම්බර් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 නොවැම්බර් මස 19 වැනි දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[196 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 006816—750(2012/12)

## ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

### ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම” යනුවෙන් හඳුන්වනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී පදනමේ පරමාර්ථ හා ඊට අදාළ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

**1.** මේ පනත 2012 අංක දරන “ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම” (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනමෙහි දැනට සාමාජිකයන් වශයෙන් සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් සඳහන් කරනු ලබන) “ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මාර්ග සංවර්ධන හා නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ද ආරෝග්‍යශාලා කලායතන, අධ්‍යාපන මධ්‍යස්ථාන, පාසල්, ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම හා දියුණු කිරීම් ද

2 —PL 006713 -75(2012/10)

නගර හා ග්‍රාම සංවර්ධන සඳහා ආධාර විය හැකි වෙනත් එවැනි වැඩ සහ ක්‍රියාකාරකම් බාර ගැනීම;

(ආ) යම් ආධාරයක් හෝ උපකාරයක් අවශ්‍ය ශිෂ්‍යයන්ට ආධාර සහ උපකාර කිරීම ;

(ඇ) පුස්තකාල, කියවීම ශාලා සහ අභ්‍යාස මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඈ) පොත්පත්, වාර ප්‍රකාශන සහ සඟරා රැස්කිරීම, මුද්‍රණය කිරීම, ප්‍රසිද්ධ කිරීම සහ බෙදාහැරීම ;

(ඉ) පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සංවිධාන සමග සහචර්ය වීම;

(ඊ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභසාධන, අධ්‍යාපනික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි නිරත වීම ;

(උ) අධ්‍යාපනය, සෞඛ්‍ය, ක්‍රීඩා, සංස්කෘතික අංග හා කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සහ දැනුම දියුණු කිරීම, ව්‍යාප්ත කිරීම, ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මුල්‍යාධාර සැපයීම සහ ආයතන පිහිටුවීම ;

(ඌ) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සහ පාරම්පරික ඥානයට අයත් විෂය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම සහ ආයතන පිහිටුවීම ;

(එ) පරිසරය ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති ආරම්භ කොට පවත්වාගෙන යාම ; සහ

(ඒ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම ;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු හත් දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) පදනමේ ආරම්භක සාමාජිකයා වූ ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ යාවජීව සභාපතිවරයා විය යුතු අතර, ඉන් අනතුරුව එවකට සභාපතිවරයා ලෙස ධුරය දරන තැනැත්තාගේ ලඟම ඥාතියා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඊළඟ සභාපතිවරයා විය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) සභාපතිවරයා හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මිය යෑම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හළහොත් මිස, අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. මිය යෑම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සාමාජිකයකු පත්කළ යුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු හතරක් ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම;

(ආ) සංස්ථාවේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය ද, ඔවුන්ගේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වීම සඳහා අවශ්‍ය කරන සුදුසුකම්; සහ

(ඉ) සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සහ එවැනි ම රැස්වීමක දී වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම සංශෝධනය කිරීම, හෝ ඒවා පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතුය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ගෙවා නිදහස් කළ යුතු සම්මාදම් මුදල් හෝ දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ සංස්ථාව වෙනුවෙන් මෙතෙක් භාර ගන්නා ලද හෝ මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් වූ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කළ යුතු ය.

(2) මෙම පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.*

**9.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, බද්දට ගැනීමක්, තෑගි කිරීමක්, කිසියම් ගිවිසුමක් මත හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට හා දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

*සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.*

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.*

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ ඉතිරිවන දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ ඉතිරිවන දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර සංස්ථාවේ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

*විගණනය සහ ගිණුම්.*

**12.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය විසින් තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණනකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ 'සුදුසුකම්ලත් විගණකවරයා' යන්නෙන් :—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද ; ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ එක් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුවද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීමට සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.